## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - 2015

-----------------------------------------------------

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-------------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

------------------------------------

මෙම වාර්තාවේ 2.2. ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය ව්‍යාචනය

-------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

------------------------------------

මණ්ඩලය දිගින් දිගටම අලාභ ලැබීම මත ශුද්ධ වත්කම් විශාල ලෙස ඛාදනයට ලක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ශුද්ධ වත්කම් රු. 28,977,203,239 ක ඍණ අගයක් වී තිබුණි. භාණ්ඩාගාරයේ හෝ රජයේ මූල්‍ය සහායක් නොමැතිව ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව අවිනිශ්චිතතාවයක් ඇති විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය තත්ත්වය විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ ජංගම වගකීම් ආවරණය කරගැනීම සඳහා ඇති ජංගම වත්කම් ප්‍රමාණය මුළු ජංගම වගකීම්වලින් සියයට 34 ක ට වඩා පහළ මට්ටමක පැවති අතර 2010 වර්ෂයේදී මෙම මට්ටම සියයට 42 ක් ලෙස පැවතුණි. ගෙවිය යුතු මුදල් නියමිත පරිදි නොගෙවීම, අය කරගත යුතු මුදල් අය කරගැනීමට කටයුතු නොකිරීම හා දීර්ඝ කාලීනව නිරවුල් නොවී පවතින ශේෂ මෙම තත්ත්වය ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

#### (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 32 ඡේදය ප්‍රකාරව ප්‍රමිතයක් මගින් අවශ්‍ය කෙරෙන හා අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවත් පහත සඳහන් හිලව් කිරීම් සිදුකර තිබුණි.

(i) ඉදිරිපත්කළ උපලේඛන අනුව බැංකු ගිණුම් 30 ක වාසිදායක මුදල් ශේෂ රු. 27,390,759 කින් අයිරා ශේෂ හිලව් කර තිබීම සහ බැංකු ගිණුම් 14 ක අයිරා ශේෂ රු. 20,691,606 ක් වාසිදායක ශේෂ සමග හිලව් කර තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල බැංකු මුදල් ශේෂය හා බැංකු අයිරාව පිළිවෙලින් රු. 45,853,652 ක් හා රු. 45,853,652 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) ඩිපෝ හා ප්‍රාදේශීය කාර්යාල 3 ක එකතුව රු. 649,233,033 ක් වූ වෙළඳ ණයහිමි ශේෂයෙන් රු.32,700,544 ක ණයහිමි හර ශේෂ හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ ණයහිමි ශේෂ ලෙස රු. 616,532,489 ක් දක්වා තිබුණි.

(iii) කළුතර රියදුරු පුහුණු පාසලේ රු. 12,657,758 ක් වූ වෙළඳ ණයගැති ශේෂයෙන් රු.46,080 ක බැර ශේෂයක් හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(iv) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු රු.66,516,172 ක් වූ ශේෂයෙන් රු.45,568,987 ක හර ශේෂයක් හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07

සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා තිබු රු. 120,428,954 ක තොග ගැලපීම් ගිණුමේ ශේෂය හා රු. 42,471,837 ක් වූ ඉන්ධන අතිරික්තතා හා ඌනතා ගිණුමේ ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් නොවන අයිතම යටතේ ගැලපීම් කර නොතිබුණි.

#### (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 55 ඡේදය ප්‍රකාරව වත්කම ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට පත්කළ අවස්ථාවේ සිට ඵලදායී ජීවිත කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් ක්ෂය කළ යුතු නමුත් මණ්ඩලය සමාලෝචිත වර්ෂයේදී අත්පිට හා ලීසිං වශයෙන් මිලදීගෙන ප්‍රයෝජනයට ගෙන තිබූ වටිනාකම රු. 51,541,669 ක දේපළ, පිරියත හා උපකරණ වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 58 ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙන් වෙන්ව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල වෙනම දැක්විය යුතු වුවද ඊට පටහැනි ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් සහ ගොඩනැගිලි ලෙස රු.319,799,319 ක් දක්වා තිබුණි. එම මුළු වටිනාකමෙන් සියයට 50 ක් එනම් රු.159,899,660 ක් ගොඩනැගිලි වටිනාකම ලෙස සලකා එම වටිනාකම මත සියයට 2.5 බැගින් වාර්ෂිකව ක්ෂය ගණනය කර තිබීම නිසා 2015 වර්ෂය වන විට ගොඩනැගිලිවල පිරිවැය ඉක්මවා රු. 1,048,812 ක් ක්ෂය කර තිබුණි.

(iii) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 3,037,266,897 ක් වූ වත්කම් අයිතම 988 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි.

(iv) 2006 වර්ෂයේ සිට මිලදී ගෙන තිබූ වටිනාකම රු. 1,004,452,160 ක් වූ බස් රථ එංජින් 825 ක් බස් රථවලට සවිකිරීමේදී අදාළ බස් රථයේ වටිනාකමට ප්‍රාග්ධනිත කර ආයුකාලය නැවත ඇස්තමේන්තු කළ යුතු වුවද ඊට පටහැනිව, මිලදී ගත් බස් රථ එංජින් වෙනම ගිණුම්ගත කර 20% බැගින් ක්ෂය කර තිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 31 (බී) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල කල්බදු වගකීම දැක්වීමේදී එම කල්බදු වත්කම්වල සාධාරණ අගය හෝ ගෙවීමට ඇති කල්බදු වාරිකවල වර්තමාන අගය යන දෙකින් අඩු අගය දැක්විය යුතු අතර, එය පහත සඳහන් පරිදි හෙළිදරව් කළ යුතු විය. ඊට පටහැනි ලෙස මණ්ඩලය විසින් මූල්‍ය කල්බදු වගකීම පිරිවැය මතද, පොළී ප්‍රමාණය වාරික ගණනේ එකතු ක්‍රමය (Sum of digit method) මතද ගණනය කර රු. 10,032,569,943 ක් කල්බදු වගකීම යටතේ දැක්වීම පමණක් සිදුකර තිබුණි.

- කාලපරිච්ඡේදය අවසානයට අවම කල්බදු වාරිකය හා එහි වර්තමාන අගය සැසඳීම.
- වසරකට නොඅඩු කාලයකට, වසරකට වැඩි සහ වසර 05 කට අඩු සහ වසර 05 කට වැඩි කාලපරිච්ඡේදයන්ට අදාළව ගිණුම් කාලපරිච්ඡේදය අවසානයට වූ අනාගත කල්බදු වාරිකවල එකතුව හා ඒවායේ වර්තමාන අගයේ එකතුව.

**(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

---

ප්‍රමිතයේ 57 ඡේදය ප්‍රකාරව පශ්චාත් සේවක ප්‍රතිලාභ වගකීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය පදනම් කරගෙන නිවැරදි ඇස්තමේන්තුවක් සිදුකළ යුතු වුවත් එලෙස කටයුතු නොකර එක් එක් ශ්‍රේණියේ මධ්‍යයන වැටුපට ජීවන වියදම් දීමනාව හා අතිරේක දීමනා එකතු කර නිලධාරීන් ගනනින් වැඩි කිරීම මගින් මුළු පාරිතෝෂික වෙන් කිරීම් ප්‍රමාණය ගණනය කර තිබුණි.

## 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම් අනුව ඩිපෝ 09 ක බැංකු ගිණුම් වෙත සෘජුව ලැබීම් හා බැංකු ගාස්තු පිළිවෙලින් රු.36,612,935 ක් හා රු. 2,629,593 ක් ආදායම් හා වියදම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. අවස්ථා 07 කදී මුදල් පොතේ දෙවරක් හර කර තිබුණු රු. 1,973,578 ක් නිවැරදි කර නොතිබුණු අතර අවස්ථා 40 කදී සෘජු බැරවීම්,රු. 7,885,175 ක් දිගුකාලීනව නිරවුල් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී අත්පිට හා ලීසිං ක්‍රමයට මිලදී ගනු ලැබූ රු. 1,751,869,409 ක් වටිනා බස් රථ වෙනුවෙන් රු.201,247,403 ක ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ පාරිතෝෂික දීමනා වෙන්කිරීමේදී අන්තර් දීමනාව වැටුප් හා වේතනවලට එකතු කිරීම හේතුවෙන් රු. 357,740,000 ක් වැඩියෙන් පාරිතෝෂික වෙන්කිරීම් සිදු කර තිබුණි.

(ඈ) 2015 වර්ෂය සඳහා රු. 31,619,700 ක් වටිනා ඉලෙක්ට්‍රොනික් ටිකට් යන්ත්‍ර 900 ක් මිලදී ගෙන ඩිපෝ වෙත නිකුත් කර තිබුණ ද ඩිපෝ වත්කම් යටතේ එය රු.28,863,689 ක් ලෙස සටහන් වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ශේෂය හා ගෙවිය යුතු ප්‍රධාන කාර්යාල ජංගම ගිණුමේ ශේෂය රු. 2,756,011 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) කතරගම විශ්‍රාම ශාලාව වැඩි දියුණු කිරීම 2015 ජූලි 16 දින නිමකර තිබුණද එහි ඉදිකිරීම් පිරිවැය වූ රු. 14,813,358 ක් ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. එමනිසා එදින සිට දෙසැම්බර් 31 දක්වා එම ගොඩනැගිල්ලට අදාළ ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) හොරොව්පතාන නව ඩිපෝවේ ඉදිකිරීම් කටයුතු නිමකර 2012 ජුනි 10 දින සිට මණ්ඩලයේ කටයුතු සඳහා භාවිතාකර තිබුණද, එහි ඉදිකිරීම් කටයුතු සඳහා දරන ලද රු. 32,436,772 ක් ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ ලෙසින් දක්වා තිබුණි. ඒ හේතුවෙන් මෙම ගොඩනැගිලි සඳහා පසුගිය වර්ෂ 3 ½ කාලයකට අදාලව රු. 2,838,218 ක් වූ ක්‍ෂය ගණනයකර ගිණුම්ගත කිරීම මගහැරී තිබුණි.

(උ) මූල්‍ය ප්‍රකාශන අනුව මධ්‍යම බස්රථ කාර්යාලයේ එකතුව රු.9,000,000 ක් වූ ස්ථාවර තැන්පතු දෙක සඳහා ලැබුණු රු. 4,548,371 ක් වූ පොලිය නැවත ආයෝජනය කර තිබුණද එම වටිනාකමින් ආයෝජන ගිණුම හර කිරීම වෙනුවට ලැබිය යුතු ආදායම් ගිණුම හර කර තිබුණි.

(ඌ) 2015 ජුනි 01 දින සිට 2015 දෙසැම්බර් 31 කාල පරිච්ඡේදය සඳහා ස්ථාවර තැන්පතුවක් වෙනුවෙන් ලැබිය යුතු පොළිය රු. 162,503 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) සිවිල් ආරක්‍ෂක බලකාය වෙත නිකුත් කළ බලපත්‍ර වෙනුවෙන් ලැබිය යුතු රු. 8,183,702 ක මුදල දෙවරක් වර්ෂයේ ආදායමට සහ ලැබිය යුතු ආදායම් ලෙස සටහන් කිරීම නිසා එම වටිනාකමින් වර්ෂයේ අලාභය අඩුවෙන් හා ලැබිය යුතු බලපත්‍ර ගාස්තු වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

(ඒ) මධ්‍යම බස්රථ කාර්යාලයේ 2015 වර්ෂය සඳහා අයවිය යුතු රු. 1,726,367 ක කඩකුලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය අවසානයේදී ගර්භිත බස්රථ වටිනාකම රු. 1,592,669,139 ක් වූ අතර බස්රථයක සුන්බුන් අගය රු. 1000 ක් වශයෙන් හඳුනාගෙන තිබුණද එම සුන්බුන් අගය ද ඉක්මවා රු. 2,924,746 ක් ක්‍ෂය වෙන්කිරීම් සිදුකර තිබුණි.

## 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට අනුව දේපළ පිරියත හා උපකරණ ක්ෂය වටිනාකම රු. 2,146,560,160 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ක්ෂය වටිනාකම රු. 2,147,944,061 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු. 1,383,901 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව බස් රථ 427 ක් විකිණීමෙන් රු. 60,759,000 ක ආදායමක් වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණ ද කාර්මික අංශයේ තොරතුරු අනුව බස් රථ 584 ක් විකිණීමෙන් රු. 85,424,111 ක ආදායමක් ලැබී තිබූ බව සටහන් කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ආදායම හා කාර්මික අංශයේ පොත්පත් අනුව රු. 24,665,111 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) කළුතර රියදුරු පාසලේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බදුල්ල ඩිපෝව වෙතින් රු. 3,091,346 ක් හා ඌව, සබරගමුව ප්‍රාදේශිකයන්ගෙන් සහ කතරගම ඩිපෝවෙන් එකතුව රු. 6,756,442 ක් ලැබිය යුතු ශේෂ ලෙස දක්වා තිබුණි. එහෙත් බදුල්ල ඩිපෝවේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ශේෂය ලෙස රු. 2,871,970 ක් පමණක් දක්වා තිබුණි.

(ඈ) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව උඩහමුල්ල රියදුරු අභ්‍යාස විද්‍යාලයෙන් ප්‍රධාන කාර්යාලයට අයවිය යුතු මුදල් ලෙස රු. 1,033,171 ක් දක්වා තිබුණද උඩහමුල්ල රියදුරු අභ්‍යාස විද්‍යාලයේ ගිණුම් අනුව ප්‍රධාන කාර්යාලයට ගෙවිය යුතු මුදල රු. 570,834 ක් වූයෙන් වෙනස රු. 462,337 ක් විය.

## 2.2.5 අවිනිශ්චිත ගිණුම්

----------------------

අවිනිශ්චිත ගිණුමේ හර හා බැර ශේෂ ගැලපීමෙන් පසු රු. 3,941, 993 ක් වූ බැර ශේෂය දීර්ඝ කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

## 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------------

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | වෙළඳ ණයහිමියෝ | 228,781,504 | |
| (ii) | වැඩපල ණයහිමියෝ | 64,187,315 | |
| (iii) | කැෂියර් හිඟ ශේෂය | 1,271,364 | |
| (iv) | කොන්දොස්තර අක්‍රමිකතා | 15,249,736 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (v) | විවිධ ණයගැතියෝ | 99,647,683 | |
| (vi) | ලැබිය යුතු ආදායම් | 253,051,561 | |
| (vii) | පාරිතෝෂික දීමනා | 3,641,172,333 | මුදල් ගෙවූ නිලධාරීන් පිළිබඳ තොරතුරු |
| (viii) | වෙළඳ ණයගැති ශේෂය | 3,193,451 | උපලේඛන |
| (ix) | ජංගම ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම් සහ ස්ථාවර තැන්පතු ගිණුම් | 2,087,218,462 | ගිණුම් 91 ක් සඳහා ශේෂ සනාථ ලිපි |
| (x) | ඉඩම් හා ගොඩනැගිලි | 319,799,318 | වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛනය හා තක්සේරු වාර්තා |
| (xi) | ජර්නල් සටහන් 06 | 5,016,723,610 | ජර්නල් සටහන්වලට අදාළ විස්තර |
| (xii) | තොග | 744,821,576 | විස්තරාත්මක තොග වාර්තා |
| (xiii) | කාර්යසාධන බැඳුම්කර | 1,312,727 | විස්තරාත්මක ලිපි ලේඛන |
| (xiv) | හොරොව්පතාන නව ඩිපෝව ඉදි කිරීම | 4,548,536 | ඇස්තමේන්තු මුදල ඉක්මවීමට අදාළ අනුමැතිය සහිත ලිපි |
| (xv) | ගමන් බලපත්‍ර ආදායම් වට්ටම් | 399,385,714 | වට්ටම් අනුමත කිරීමේ ලිපි ලේඛන |
| (xvi) | බැංකුවට බැර නොකළ ශේෂයන් | 2,843,042 | බැර ශේෂයන් හි වයස් විශ්ලේෂණය |
| (xvii) | මුදල් පොතට වැඩිපුර හර කළ ශේෂයන් | 457,460 | කාලය සනාථ කරන ලිපි, විස්තරාත්මක උප ලේඛන |
| (xviii) | බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි දක්වා ඇති හර නොවූ චෙක්පත් | 7,090,334 | ශේෂ සනාථ ලිපි විස්තරාත්මක උප ලේඛන |
| (xix) | ක්‍රියාකාරී නොවූ ගිණුම් - හර | 9,935,375,095 | කාල විශ්ලේෂණ හා ශේෂ සනාථ ලිපි |
| (xx) | ක්‍රියාකාරී නොවූ ගිණුම් - බැර | 26,054,948,782 | කාල විශ්ලේෂණ හා ශේෂ සනාථ ලිපි |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලය තුල ත්‍රස්ත විපත්වලින් මියගිය සේවකයන්ට ගෙවූ වැටුප් ලෙස ගිරිඋල්ල ඩිපෝවට රු.1,569,519 ක් හා අලව්ව ඩිපෝවට රු. 2,174,792 ක් භාණ්ඩාගාරයෙන් අය විය යුතුව පැවතුණි.

(ආ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ආරක්ෂක නිලධාරීන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, පුද්ගලික ප්‍රවාහන අමාත්‍යාංශය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව සහ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයට සේවයේ යොදවා තිබූ අතර එම ආරක්ෂක නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් රු. 40,604,269 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. 2013 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 වන විට තවදුරටත් රු. 36,922,769 ක් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශිකයන් 5 කට අදාලව බාහිර පාර්ශවයන්ට ගෙවිය යුතු වසර 10 කට වඩා පැරණි එකතුව රු. 12,070,995 ක් වූ ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බදුල්ල ඩිපෝවෙහි 2011 වර්ෂයේ සිට පැවත එන හිඟ කැෂියර් ශේෂය රු. 33,662,732 ක් හා මොණරාගල හා බදුල්ල ඩිපෝවෙහි ලැබිය යුතු ශේෂ පිළිවෙලින් රු. 9,260,302 ක් හා රු. 8,455,334 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය තෙක් කටයුතු කර නොතිබුණි.

(ඉ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මිලදී ගැනුම් අත්තිකාරම් ගිණුමෙහි නොපියවූ ශේෂයන්ට අදාළ කාල විශ්ලේෂණය අනුව රු. 1, 778,661,537 ක් හෙවත් සියයට 93 ක් වසර 01 කට පෙරද සියයට 38 ක් හෙවත් රු. 721,380,174 ක් වසර 2 ට පෙරද ලබා දුන් අත්තිකාරම් වන අතර ඒවා නිරවුල් කර නොතිබුණි.

(ඊ) බැංකු ගිණුමකට අදාළව ලැබිය යුතු ආදායම්වලින් රු.193,375,188 ක් හිඟව පැවති අතර එම මුදලින් අර්ථසාධක අරමුදල් ණය ගිණුමට අදාළව ලැබිය යුතු මුදල මුළු මුදලින් සියයට 81 ක් වන අතර ඒ සඳහා වයස් විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු යුධ හමුදා ගමන් බලපත්‍ර හා විශේෂ කුලී ආදායම් පිළිවෙලින් රු.41,784,537 ක් හා රු.188,616,652 ක් අයකර ගෙන නොතිබුණි.

(ඌ) 2008 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු ආදායම් යටතේ බණ්ඩාරවෙල ඩිපෝවෙහි ශේෂය රු. 1,108,756 ක සිට රු. 12,537,456 ක් දක්වා වැඩිවෙමින් පැවති අතර ඒ අනුව අය නොවීමේ ප්‍රතිශතය සියයට 43 සිට සියයට 90 දක්වා වූ පරාසයක පැවතුණි.

(එ) මධ්‍යම බස්රථ කාර්යාලය විසින් බදු දී ඇති කඩකාමර වෙනුවෙන් 2015 වර්ෂයට අදාළ බිල්කළ විදුලිය හා ජල බිල්පත් ගාස්තු පිළිවෙලින් රු. 2,314,383 ක් හා රු. 1,197,133 ක් වූ අතර, අදාළ කාලය තුළ මුදලින් ලද වටිනාකම පිළිවෙලින් රු. 1,816,471 ක් හා රු. 866,601 ක් පමණක් ගිණුම්ගත කිරීම හේතුවෙන් ලැබිය යුතු ශේෂයන් හා ආදායම් රු.828,444 ක් ගිණුම්ගත වී නොතිබුණි.

(ඒ) මධ්‍යම බස්රථ කාර්යාලයේ හිඟ කඩකුලී ආදායම ලෙස රු. 1,863,414 ක මුදලක් 2009 වර්ෂයේ සිට පැවත එන අතර එම මුදල අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතුවල රු. 19,733,819 ක් ආයෝජනය කර තිබුණද ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) | 1981 අංක 26 දරන පනතින් සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 16 වගන්තිය | මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවලට අයත් රු.1,662,003,377 ක දායක මුදල් සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5 (1) වගන්තිය හා 1992 අංක 62 දරණ (සංශෝධිත) පනත | සේවය අවසන් කර දින 30 ක් ඇතුළතදී පාරිතෝෂික දීමනා ගෙවීම් සිදුකළ යුතු වුවද 2015 හා ඊට පෙර වර්ෂවලදී විශ්‍රාම ගිය ඩිපෝ 5ක සේවකයන් 172 නකු වෙත ගෙවිය යුතු රු. 67,244,193 ක පාරිතෝෂික දීමනා 2015 දෙසැම්බර් 31 දිනට වසර 1 සිට වසර 19 දක්වා පරාසයක ප්‍රමාදයක් සිදු වී තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 177 (1) | ලැබෙන මුදල් දිනපතා හෝ හැකිතාක් ඉක්මනින් ප්‍රේෂණය කළයුතු වුවත්, බදුල්ල ඩිපෝවෙහි 2012 වර්ෂයේ සිට 2015 දක්වා වූ රු. 34,249,522 ක මුදලක් අඩුවෙන් බැංකුගත කර තිබුණු අතර ඩිපෝව විසින් අඩුවෙන් තැන්පත් කිරීම හඳුනාගෙන අවශ්‍ය කටයුතුකර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 177 (3) | වලපනේ හා තෙල්දෙණිය ඩිපෝ විසින් 2014 හා 2015 වර්ෂවලදී එකතු කර තිබූ රු. 1,214,386 ක ආදායමක් 2015 දෙසැම්බර් 31 දක්වාම බැංකුගතකර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 395 (ආ) | සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය මගින් පවත්වාගෙන යන ජංගම බැංකු ගිණුම් 156 න් ජංගම ගිණුම් 59කට අදාළ බැංකු සැසඳුම් වාර්තා විගණනය කිරීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 395 (ඉ) | නියැදි පරීක්ෂණයට අනුව බැංකු ගිණුම් 7ක එකතුව රු. 20,838,069 ක් සඳහා නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් හා බැංකු ගිණුමක එකතුව රු.129,845 ක තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් පිළිබඳ උපලේඛන බැංකු සැසඳුම් ප්‍රකාශනයේ ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 396 (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළව විගණනයට ඉදිරිපත් වූ බැංකු ගිණුම් 95න් බැංකු ගිණුම් 15 ක සැසඳුම් ප්‍රකාශනවල මාස 06 ඉක්ම වූ නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් 58 ක එකතුව රු.1,880,020 ක් විය. මෙම චෙක්පත් වර්ෂ 04ක පමණ දීර්ඝ කාලයක සිට පැවතුණද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 395 (ඌ) | නිලධාරීන්ට රාජකාරී පැවරීමේදී මුදල් පොත පිළියෙල කිරීමට සම්බන්ධ නොවූ පුද්ගලයෙකුට බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ කාර්යය පැවරිය යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (vii) | මුදල් රෙගුලාසි සංග්‍රහය 757 | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 11,633,840,656 ක් වටිනා දේපළ පිරියත හා උපකරණ මණ්ඩලය සතු වුවද එම සියලු වත්කම් ඇතුළත් වන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.751,260,743 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,228,021,529 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 476,760,786 කින් අඩු වී තිබුණි. මණ්ඩලයේ මෙහෙයුම් වියදම් රු. 4,566,344,326 කින් සහ පරිපාලන වියදම් රු. 1,612,418,157 කින් වැඩි වී තිබුණ ද මගී ප්‍රවාහන ආදායම සහ අනෙකුත් ආදායම් රු. 7,045,280,367 කින් වැඩිවීම ඉහත පිරිහීම අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා මණ්ඩලයේ ඌනතාවය ක්‍රමයෙන් වැඩි වී තිබුණු අතර 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඌනතාවය ක්‍රමයෙන් අඩු වී තිබුණි. සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු මණ්ඩලයේ දායකත්වය 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී වර්ධනය වී තිබූ අතර 2012 වර්ෂයේ දී රු. 11,499,778,412 ක් වූ දායකත්වය 2015 වර්ෂයේ දී රු. 21,644,512,472 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන පනතට අනුව මණ්ඩලයේ අරමුණු පහත දැක්වේ.

- ජාතික ගමනාගමන කොමිෂන් සභාව සහ අදාළ පළාත් ප්‍රවාහන අධිකාරිය විමසා ආර්ථික ස්ථාවරත්වය ඇතිකරමින් කාර්යක්ෂම සහ ඵලදායී විධිමත් බස් සේවාවක් සැපයීම.
- ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලයේ යෝජනා ඇතුළත් කරමින් සහ ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතු ආකාරය හඳුනා ගනිමින් සහ විවිධ යෝජනා සඳහා වගකිව යුතු අදාළ පරදු තබන්නන් හඳුනා ගනිමින් සහ සම්පූර්ණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී ගතවීමට ඉඩ ඇති කාල සීමාව සඳහන් කරමින් මණ්ඩලය විසින් වාර්ෂික සැලැස්මක් පිළියෙල කළ යුතුය.එම වාර්ෂික සැලැස්මට අදාළ වාර්ෂික අයවැයක්ද පිළියෙල කළ යුතුය.
- මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රබලත්වය උපරිමයක් වන බවට සහතික වීම සඳහා එම මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යායුතු ආකාරයට මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාම.
- පොදු ප්‍රවාහන සේවයේ ගුණාත්මකභාවය වැඩි දියුණු වන ආකාරයට ප්‍රවාහන ක්ෂේත්‍රයේ වෙනත් යෝජනා ක්‍රම හෝ සේවා ක්‍රියාත්මක කිරීම.

2015 වර්ෂයේ මණ්ඩලයේ අරමුණු ඉටු කිරීම සම්බන්ධයෙන් සංයුක්ත සැලැස්මට අනුව සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව සහ අයවැය ලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත අනුව මණ්ඩලයේ බලතල අනුව ක්‍රියාත්මක කළ හැකි පහත දැක්වෙන කාර්යයන් සංයුක්ත සැලැස්ම සැකසීමේ දී අවධානය යොමු වී නොතිබුණි.

- මණ්ඩලය විසින් ප්‍රවාහනය කරනු ලබන මගීන් සඳහා බස් නැවතුම්පලවල් හෝ ආවරණ සැපයීම.
- ප්‍රායෝගික නොවන හෝ දුෂ්කර බවට මණ්ඩලය විසින් සලකනු ලබන මාර්ගවල බස් සේවා සැපයීම.
- මණ්ඩලයට අයත් බස් රථ නැවතුම් ස්ථාන සපයාදීම සහ නඩත්තු කිරීම.

(ආ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළ ලඟා කරගැනීමට බලාපොරොත්තු වූ ඉලක්ක සම්බන්ධයෙන් පහත නිරීක්‍ෂණ කරනු ලැබේ.

(i) දෛනිකව ධාවනය කරනු ලබන බස්රථ ප්‍රමාණය 6000 ක් දක්වා ඉහළ නැංවීමට ඉලක්කකර තිබුණද සැලසුම් අංශයේ වාර්තා අනුව දෛනිකව ධාවනය කර තිබුණේ බස්රථ 5270 ක් පමණි. මේ අනුව සියයට 12 ක ඉලක්කයක් ලඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) 2015 වර්ෂයේදී ධාවනය කිරීමට අපේක්ෂිත කිලෝමීටර් ප්‍රමාණය 643,184,516 ක් වුවත් ධාවනය කර තිබුනේ කිලෝමීටර් 440,424,544 ක් පමණි. ඒ අනුව ඉලක්කගත කිලෝමීටර් ප්‍රමාණයෙන් 202,759,972 ක් හෙවත් සියයට 31.5 ක් ධාවනය කිරීමට නොහැකි වී තිබුණි.

(iii) දෛනික මාර්ග ලේඛන ආදායම රු. මිලියන 80 ක් දක්වා ඉහළ නැංවීමට සැලසුම්කර තිබුණ ද, රු. මිලියන 66 ක ආදායමක් පමණක් ලබාගෙන තිබුණි. මේ අනුව ඉල්ලකගත ප්‍රමාණයෙන් සියයට 17.5 ක දෛනික ආදායමක් ලබාගෙන නොතිබුණි.

(ඇ) පූර්ණ වශයෙන් අළුත්වැඩියා කළ යුතු බස්රථ හා දෛනිකව ඇතිවන සුළු අළුත්වැඩියා හේතුවෙන් ධාවනයෙන් ඉවත්වන බස්රථ අළුත්වැඩියා කර ධාවනයට එක් කිරීමට අරමුණු කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දිනට පැවති මුළු බස්රථ ඇණිය 7,797 ක් වුවද පහත දැක්වෙන හේතු මත එම බස්රථ ඇණියෙන් බස්රථ 1,511 ක් හෙවත් සියයට 20 ක් පමණ ධාවනය කිරීමට නොහැකි තත්ත්වයේ පැවතුණි.

| විස්තරය | ධාවනය නොවන බස්රථ සංඛ්‍යාව |
|---|---|
| ටයර්, ටියුබ් සහ බැටරි නොමැතිව නතර වූ බස්රථ | 169 |
| කට්ටල්, උපකට්ටල් නොමැතිව නතර වූ බස්රථ | 400 |
| තඩාග සිදුවෙමින් පවතින බස්රථ | 90 |
| හදිසි අනතුරු අළුත්වැඩියාවේ පවතින බස්රථ | 77 |
| ධාවනය වීමේ දී ඇතිවන සුළු කාර්මික දෝෂ නිසා අළුත්වැඩියාවේ පවතින බස්රථ | 261 |
| කට්ටල් අළුත්වැඩියාවේ පවතින බස්රථ | 226 |
| විශාල අළුත්වැඩියා සඳහා නතර වී ඇති බස්රථ | 260 |
| අළුත්වැඩියාවෙන් ආර්ථික වාසි නොවන බස්රථ | 28 |
| **මුළු එකතුව** | **1511** |

බස්රථ වලින් 569 ක් ටයර්, ටියුබ් හා කට්ටල් නොමැතිවීම හේතුවෙන් ධාවනයට යොදවා නොතිබුණි. එමෙන්ම එම බස්රථ ඇණියෙන් 778 ක් අවුරුදු 15කට වඩා පැරණි බස්රථ විය.

(ඇ) බස්රථ පුනරුත්ථාපනය කර රථ ඇණියට එක් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයට රු. මිලියන 880 ක් මණ්ඩලයෙන් වෙන්කර තිබුණු අතර 2015 වර්ෂය තුළ දී රු. මිලියන 1037.12 ක් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් එම මුළු මුදල වූ රු. මිලියන 1,917.12 ක් වියදම් කර තිබුණ ද මණ්ඩලයේ සැලසුම් අංශයේ වාර්තා අනුව පුනරුත්ථාපනය සඳහා ඉලක්කගත ප්‍රමාණයෙන් බස්රථ 861 ක් හෙවත් සියයට 48 ක් පුනරුත්ථාපනය කරගත නොහැකි වී තිබුණි. අපේක්ෂිත ඉලක්කයන් ලඟා කර ගැනීම පිළිබඳව විස්තරාත්මක තොරතුරු පහත දැක්වේ.

| | 2015 වර්ෂය | | |
|---|---|---|---|
| විස්තරය | ඉලක්කය | සත්‍ය තත්ත්වය | ලඟාකර ගැනීමට නොහැකි වු ප්‍රමාණය |
| එන්ජින් කට්ටල් | 720 | 500 | 220 |
| ගියර් පෙට්ටි | 720 | 173 | 547 |
| බස් බෝඩි | 360 | 266 | 94 |
| **එකතුව** | **1800** | **939** | **861** |

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය සතු අක්කර 127 ක ඉඩම් වෙනත් ආයතන හා පුද්ගලයන් විසින් භුක්ති විඳිනු ලබන අතර එම ඉඩම් ආපසු ලබා ගැනීමට, නීත්‍යානුකූලව පැවරීමට හෝ විකිණීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ඉඩම් අක්කර 18 ක් මණ්ඩලය විසින් දීර්ඝ කාලීනව බදු පදනම යටතේ භාවිතා කරමින් පැවතියද ඒ සඳහා ඉඩම් ආඥා පනතට අනුව ලබා ගතයුතු නිදහස් දීමනා පත්‍ර ලබාගැනීමට විගණිත දින වූ 2017 සැප්තැම්බර් 15 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 1966 ජුලි 26 සිට බදු පදනම යටතේ ලබාගෙන තිබුණු කොළඹ 05, උද්‍යාන පාරේ පිහිටි හෙක්ටයාර් 3.4125 ක්වූ ඇන්ඩර්සන් ගොල්ෆ් ලින්ක්ස් පිටිය, ශාලිකා ශාලාව හා ක්‍රීඩා පිටිය අයත් ඉඩම හා ගොඩනැගිල්ල රු. 300,000 ක වටිනාකමට මූල්‍ය ප්‍රකාශනයේ ඉඩම්

ගොඩනැගිලි යටතේ දක්වා තිබුණද, එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය මණ්ඩලය විසින් ලබාගෙන නොතිබුණි. 2009 පෙබරවාරි 18 අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව මෙම ඉඩම් සඳහා නිදහස් දීමනා පත්‍රයක් ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම් වෙත භාර දී ඇතත් විගණිත දිනය වූ 2017 සැප්තැම්බර් 15 වන විටත් නිදහස් දීමනා පත්‍රයක් ලබාගෙන නොතිබුණි

(ඈ) 2004 සැප්තැම්බර් 15 දිනැති අංක අමප 04/1196/023/015-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය සතු මහරගම දෙහිවල පාරේ පිහිටි 9167 දරන මූලික පිඹුරේ දැක්වෙන තහනම් කැලේ වත්ත පර්. 160.02 ක ඉඩම (හෙක්ටයාර් 0.4055) 2004 නොවැම්බර් 09 දින මණ්ඩලය විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දී තිබුණි. මෙම ඉඩම 2016 පෙබරවාරි මාසයේදී රු. 112,000,000 කට රජයේ තක්සේරු විසින් තක්සේරු කර තිබුණු අතර 2017 සැප්තැම්බර් 15 විගණිත දින වන විටද මෙම මුදල අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) 1957 අංක 48 දරන මෝටර් රථ ගමනාගමන පනත යටතේ අත්කර ගෙන තිබූ අංක 175, ගාලු පාර රත්මලානේ පිහිටි පර්චස් 26.5 ක ඉඩම රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටුවීම සඳහා දිසාපති වෙත ලබා දී ඇතත් එම ඉඩම තක්සේරු කර මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවලට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීමේදී ප්‍රධාන කාර්යාලයෙන් සැපයුම්කරුවන් තෝරාගෙන ගෙවීම් සිදු කර තිබුණ ද සැපයුම්කරුවන් විසින් ඍජුව ඩිපෝ වෙත අමතර කොටස් සපයා තිබුණි. නමුත් ඩිපෝ විසින් අදාළ ඉන්වොයිස්පත් හා භාණ්ඩ ලද බවට සහතික ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රධාන කාර්යාලයේ මිලදී ගැනුම් අත්තිකාරම් ගිණුමෙහි 2014 දෙසැම්බර් 31 දිනට රු. 1,831,859,235 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂය 2015 දෙසැම්බර් 31 දිනට රු. 1,907,294,471 දක්වා වර්ධනය වී තිබුණි. භාණ්ඩ ලැබුණු පසු මුදල් ගෙවීම කළයුතු වුවත් ඊට පටහැනි ලෙස අමතර කොටස් මිලදී ගැනීමේදී කටයුතු කර තිබීම අත්තිකාරම් ශේෂය වර්ධනය වීම කෙරෙහි හේතු වී තිබුණි.

(උ) මධ්‍යම බස්රථ කාර්යාලයේ කඩ කාමර 58 කින් 9 ක් සඳහා පමණක් 2015 දෙසැම්බර් 31 දින වන විට බදු ගිවිසුම් වලංගුව පවතින අතර ඉතිරි ගිවිසුම් 49 හි බදු කුලි ගිවිසුම් යල් පැනගිය ඒවා විය. ඒවායින් සමහර ගිවිසුම් 1970 වර්ෂයේ සිට පැවත එන බවත් එම බදු ගිවිසුම් යාවත්කාලීන කිරීම සඳහා අදාළ අංශ පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඌ) මධ්‍යම බස්රථ කාර්යාලය විසින් බදු දී ඇති කඩකාමර සඳහා උප ජල මීටර හා උප විදුලි මීටර සවිකර ජලය හා විදුලිය ලබා දෙමින් 2015 වර්ෂය සඳහා බිල්කර අයකරගත් මුදල පිළිවෙලින් රු. 1,197,133 ක් හා රු. 2,314,394 ක් වුවත් මධ්‍යම බස්රථ කාර්යාලය විසින් ජලය හා විදුලිය වෙනුවෙන් රු. 7,130,972 ක් හා රු. 7,975,010 ක් ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යම බස්රථ කාර්යාලය විසින් ජලය හා විදුලිය වෙනුවෙන් රු. 5,933,839 ක් හා රු. 5,660,616 ක් අමතර වියදම් දරා තිබුණි. මෙහිදි පරිභෝජනය කරන විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වැඩි වනවිට රේටය වැඩිවීම නිසා මධ්‍යම බස්රථ කාර්යාලය විසින් වැඩි මුදලක් ගෙවිය යුතු වන අතර කඩකුලී හිමියන්ගෙන් විදුලිය හා ජල බිල්පත් අයකර ගැනීමේදී එය නොසළකා අඩු රේටයක් අයකර ගැනීම, මෙම තත්ත්වයට හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවක සුභසාධනය සඳහා සේවක දඩ අරමුදල් ගිණුමෙන් සේවකයන් වෙත ලබා දී තිබූ ණයවලට අදාලව අයකර තිබූ රු. 84,733,235 ක ණය වාරික අදාල අරමුදලට බැර කිරීමකින් තොරව රඳවාගෙන තිබුණි.

(ආ) මණ්ඩලීය අර්ථසාධක අරමුදලින් සේවකයින් වෙත ලබාදුන් ණය සඳහා සේවක වැටුපෙන් අඩුකරගෙන තිබුණු වාරික මුදල් රු.249,486,944 ක් අදාළ අරමුදල වෙත ලබා නොදී මණ්ඩලය තුළ රඳවාගෙන තිබුණි. මණ්ඩලීය අර්ථසාධක අරමුදල වර්තමානය වන විට අහෝසි කර ඇති බැවින් මෙම මුදල් නිරවුල් කරන ආකාරය පිළිබඳ තොරතුරු විගණනයේ දී ගැටළු සහගත වී තිබුණි.

(ඇ) කතරගම විශ්‍රාම ශාලාවේ අදියර 02 හි ඉදිකිරීම් සඳහා රු. 7,912,368 ක් ගෙවා තිබියදී 2013 ජූනි 20 දින කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු අතර මග නවතා දමා තිබුණි. එම නිසා මණ්ඩලයට සිදුවූ පාඩුව අවම කර ගැනීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව රු. 658,351 ක කාර්යසාධන බැඳුම්කරය කල්පිරීමට පෙර මුදල් කර නොගැනීම සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ගෙන් එම පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් හා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුව වාහන සේවා කටයුතු සිදු කරන සියළුම ඩිපෝ විසින් ඊට අදාළව බලපත්‍රයක් ලබා ගත යුතු වුවද ඊට අදාළ ඉදිරිපත් වූ තොරතුරු අනුව ප්‍රාදේශික 6 න් ඩිපෝවන් 7 ක් පමණක් මෙම බලපත්‍රය ලබා ගෙන ඇති බවත් ඩිපෝවන් 35 ක් බලපත්‍ර ලබා ගෙන නොමැති බවත් නිරීක්‍ෂණය විය.

## 4.4 දෘශ්‍ය අක්‍රමිකතා

----------------------

2012 සිට 2015 වර්ෂය දක්වා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය සතු ඩිපෝ සඳහා නැප්කෝ නාමය යටතේ නිෂ්පාදිත දුනුකොළ සැපයීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත මුදල් ගෙවීමේදී මුදල් රෙගුලාසි 137 හා 138 පරිදි දුනු කොළ ලැබුනු බව තහවුරු කර නොගෙන නැප්කෝ සමාගම විසින් අයවිය යුතු මුදල් ලබාගැනීම සඳහා කරන ලද ඉල්ලීම පදනම් කර ගෙන මණ්ඩලය විසින් රු. 127,150,000 ක් ගෙවීම්කර තිබුණද 2017 දෙසැම්බර් 31 දින දක්වාම සැපයුම්කරු අදාළ දුනුකොළ, සපයා නොතිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) වාරියපොල හා මහව ඩිපෝවන්හි ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් ඛණිජතෙල් නීතිගත සංස්ථාව වෙත නියමිත පරිදි ගෙවීම් නොකිරීම නිසා 2015 වර්ෂයේදී රු. 2,718,706 ක මුදලක් අධිභාර ලෙස ගෙවීම්කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට පිළිවෙලින් බැර කළ යුතු රු. 5,291,223,198 ක් හා රු.52,065,963 ක් නියමිත දිනට ප්‍රේෂණය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් රු.124,276,193 ක් හා සේවක භාරකාර අරමුදල වෙනුවෙන් රු. 11,458,689 ක් අධිභාර වශයෙන් ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන කාර්යාලය වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට බැර කළ යුතු රු. 45,491,197 ක දායකය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර රු. 12,728,496 ක අධිභාර මුදලක් සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව මණ්ඩලය විසින් ගෙවීමට ඇති බවට නිරීක්ෂණය විය.

**4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදය ප්‍රකාරව මණ්ඩලය සතු සම්පත් බාහිර ආයතන වෙත මුදා නොහැරිය යුතු වුවත් මණ්ඩලයේ ආරක්ෂක අංශයේ නිලධාරීන් හා වාහන ප්‍රවාහන අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. මෙහිදී ප්‍රවාහන අමාත්‍යාංශය වෙත මුදා හැර ඇති ආරක්ෂක අංශයේ සේවකයින් වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් 2015 වර්ෂය සඳහා මණ්ඩලය විසින් රු. 4,723,789 ක් ද මාසික කුලී පදනමට ලබාගත් මෝටර් වාහන 03ක් ප්‍රවාහන අමාත්‍යාංශයට හා නියෝජ්‍ය ප්‍රවාහන අමාත්‍ය කාර්යාලයන් වෙත මුදා හැර එහි ඉන්ධන වියදම් මණ්ඩලය දරා තිබුණු අතර මෝටර් වාහන 3 ක් සඳහා කුලිය වශයෙන් රු. 356,852 ක් හා රියදුරු වැටුප් හා අතිකාල රු. 393,392 ක්ද මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

**4.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2002 වර්ෂයේදී පිරිවැය රු. 97,462,160 ක්වූ බස්රථ 143 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා වෙස්කෝ ආයතනයට යවා තිබුණි. එහෙත් වෙස්කෝ ආයතනය මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයක නොපවතින බැවින් අදාළ බස්රථ නැවත මණ්ඩලයට ගෙන්වා ගැනීම පිළිබඳ අවධානමක් පැවතියද සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල ඒ පිළිබඳ ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ තොරතුරු අනුව 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලට සේවක දායක මුදල් වශයෙන් රු. 3,695,712,194 ක් සේවක වැටුපෙන් අයකර ඇතත් එම මුදල් නියමිත පරිදි මණ්ඩලය විසින් පවත්වාගනු ලබන සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය නොකිරීම නිසා අදාළ කාලයට ලැබිය යුතු පොළී ප්‍රමාණය සේවකයන්ට අහිමි වී තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 වෙනි පරිච්ඡේදයට අනුකූලව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා සංවිධාන සටහනක්, බඳවා ගැනීමේ පරිපාටියක් හා උසස්වීම් පරිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ඩිපෝවල රියදුරු තනතුරුවල සියයට 28 ක අතිරික්තයක සිට සියයට 35 ක ඌනතාවයක් දක්වා වූ පරාසයක විහිදී තිබුණු අතර කොන්දොස්තර තනතුරුවල සියයට 51 ක අතිරික්තයක සිට සියයට 36 ක ඌනතාවයක් දක්වා විහිදී පැවතුණි. කෙසේ වුවද කොන්දොස්තර හා රියදුරු තනතුරු අතිරික්තව ඇති ඩිපෝ 25ක් වූ අතර එම අතිරික්ත කාර්ය මණ්ඩලය රියදුරු හා කොන්දොස්තර ඌනතාවය ඇති ඩිපෝවලට අනුයුක්ත කර රියදුරු කොන්දොස්තර හිඟය පියවා ගැනීමට ක්‍රියාකර නොතිබුණි. එමෙන්ම 2015 මැයි 01 දිනට කාර්යය මණ්ඩලය පිළිබඳව විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව රියදුරු සේවකයින් 235 ක් හා කොන්දොස්තර සේවකයින් 528 ක් අනුචිත කාර්යයන්හි යොදවා තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ වර්ෂ 01 මාස 05 ක් ප්‍රමාද වී එනම් 2017 ජූලි 19 දිනයේදීය.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව සැලසුම් කරන ලද කාලය තුළ අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීමට හැකිවන පරිදි කළමනාකරණයේ වගකීම පැහැදිලිව හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගැනීමකින් තොරව ලඟා කරගත නොහැකි අරමුණු හා ඉලක්ක ඇතුළත් කර පිළියෙල කර තිබුණි.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය පරිදි මණ්ඩලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද, 4.2.1 (ආ) පරිදි අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවද ඉදිරිපත් කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම එසේ සකස් කර නොතිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 2015 වර්ෂයට පිළියෙල කර තිබූ අයවැය ලේඛනයේ තොරතුරු හා 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොරතුරු සැසඳීමට හැකිවන පරිදි අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් පවතින්නේ ද යන්න හා එය ආයතනයේ මූල්‍ය කටයුතු පාලනය කිරීම සඳහා පාලන කාරකයක් ලෙස යොදා නොගන්නා බවට නිරීක්ෂණය විය.

(ආ) විගණනයේ දී සැසඳීම් කළ හැකි වූ වියදම් පරීක්ෂා කිරීමේදී මණ්ඩලයේ වියදම් අයිතමයන් 19 ක අයවැයගත වටිනාකම් සහ තථ්‍ය වටිනාකම් අතර සියයට 4 ක සිට සියයට 99 ක් දක්වා විචලනයන් පැවතුණි.

(ඇ) මණ්ඩලයේ අයවැයගත මුළු ආදායම රු. 44,417,885,626 ක් වූ අතර තථ්‍ය මුළු ආදායම රු. 39,828,386,904 ක් වුයෙන් රු.4,589,498,722 ක හෙවත් සියයට 10.34 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

## 5.5 පාරිසරික හා සමාජ වගකීම ඉටුකිරීම

2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 වගන්තියට අනුව දූෂණයට මග සලසමින් පරිසරයට අපද්‍රව්‍ය පිටමං කිරීමත්, තැන්පත් කිරීමත් හෝ මෝචනය කිරීමෙන් කෙරෙන සෑම කටයුත්තක් සඳහාම ඉහත වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගත යුතු වේ. එම ගැසට් පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ භාවිතා කරනු ලබන සෑම මෝටර් වාහනයක්ම වායු විමෝචන පරීක්ෂාවට ලක් කර අනුකූලතා සහතිකයක් ලබා ගත යුතු වන අතර නියෝග අංක 09 ට අනුව මෝටර් වාහනය යන්නට බස්රථ ද ඇතුළත් වන බව සඳහන් වී ඇති බැවින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහාද වායු විමෝචන සහතික ලබාගත යුතු වුවත් ප්‍රාදේශීය කාර්යාල 10 ක තොරතුරු අනුව 2015 වර්ෂයේ මුළු බස්රථ 6729 කින් බස්රථ 550 ක් පමණක් වායු විමෝචන සහතික ලබා ගෙන තිබුණි. ඒ අනුව මුළු බස්රථ සංඛ්‍යාවෙන් සියයට 92 ක් දුම් සහතික ලබා නොගෙන ධාවනය කිරීම නිසා රාජ්‍ය ආයතනයන් මගින් විශාල පාරිසරික හානියක් හා පාරිසරික නීති රෙගුලාසි වලට අනුකූල නොවීමක් සිදු කර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | මණ්ඩලයේ බස් රථවල විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොගැනීම. |
| | | (ii) | වත්කම් මිලට ගැනීම හා ගිණුම්ගත කිරීමේ අභ්‍යන්තර පාලනය දුර්වල වීම. |
| | | (iii) | වාර්ෂිකව වත්කම් සත්‍යාපනය සිදු නොකිරීම. |
| (ආ) | මූල්‍ය පාලනය | (i) | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු නොකිරීම හා ගෙවිය යුතු මුදල් ගෙවීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | නිවැරදි ලෙස බැංකු සැසඳුම් පිළියෙල නොකිරීම. |
| | | (iii) | අත්තිකාරම් ලේඛන පවත්වා නොගැනීම. |
| | | (iv) | සේවක ඇප තැන්පත් සඳහා ලේඛන පවත්වා නොගැනීම හා සේවක ඇප තැන්පත් මුදල් මණ්ඩලයේ වියදම් සඳහා යොදා ගැනීම. |
| | | (v) | මුදල් අංශය විසින් අවශ්‍යතාවයකින් තොරව ජංගම බැංකු ගිණුම් පවත්වාගෙන යාම, මාසික සැසඳුම් නොකිරීම හා ගැලපීම් නොකිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | අත්තිකාරම් පියවීම | (i) | ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිමවූ විගසම පියවීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | කාලීන සැසඳීම් හා පියවීම් නොකිරීම. |
| (ඇ) | ආදායම් පාලනය | | ගමන් බලපත්‍ර ආදායම් එකතු කිරීම් සඳහා අනුක්‍රමික අංක සහිත මුද්‍රිත ඉන්වොයිස් පත්‍ර භාවිතා නොකිරීම. |
| (ඉ) | ගබඩා පාලනය | (i) | ප්‍රධාන කාර්යාලයෙන් ඇණවුම්කර සැපයුම්කරුවන් විසින් ඩිපෝ වෙත සෘජුව ලබා දී තිබූ භාණ්ඩ පිළිබඳ තොරතුරු ප්‍රධාන කාර්යාලයට වාර්තා නොකිරීම හා සැසඳීම් සිදු නොකිරීම. |
| | | (ii) | පරීක්ෂාවකින් තොරව භාණ්ඩ භාර ගැනීම. |